සාමාන්‍ය සමය දෙවන ඉරුදින | **දේව ප්‍රකාශන** | 15-01-12

## පළමුවන කියැවීම

සාමුවෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි. 1සාමුවෙල් 3:3-10,19

සාමුවෙල් ද දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව තිබුණු සමිඳාණන් වහන්සේගේ ශුද්ධස්ථානයෙහි නිදාගෙන සිටියේ ය. එහි පහන එතෙක් දල්වෙමින් තිබුණේ ය. එවිට සමිඳාණන් වහන්සේ සාමුවෙල්ට අඬගැසූ සේක. ඔහු ද, "මම මෙහි ය"යි කීය. එසේ කියා, ඒලී ළඟට දිව ගොස් "ඔබ මට අඬගැසූවෙහි ය. මම මෙහි ය"යි කීවේ ය. ඒලී ද, "මම අඬනොගැසීමි; නැවත නිදාගන්නැ"යි කීවේ ය. ඔහු ගොස් නිදාගත්තේ ය. සමිඳාණන් වහන්සේ නැවතත්, "සාමුවෙල්" කියා අඬගැසූ සේක. සාමුවෙල් නැගිට ඒලී ළඟට ගොස් "ඇත්තටම ඔබ මට අඬගැසුවෙහි ය; මෙන්න මම මෙහි ය"යි කී ය. එහෙත්, ඒලී පිළිතුරු දෙමින්, "මාගේ පුත්‍රය, මම අඬනොගැසීමි, නැවතත් නිදාගන්නැ"යි කීවේ ය. සාමුවෙල් ඒ වන තුරු සමිඳාණන් වහන්සේ දැන සිටියේ නැත. ඒ වන තුරු සමිඳාණන් වහන්සේගේ වචන ඔහුට එළිදරව් නොවී ය. සමිඳාණන් වහන්සේ යළිත් තුන්වන වරටත්, සාමුවෙල්ට අඬගැසූ සේක. ඔහු නැගිට ඒලී ළඟට ගොස්, "ඔබ මට කතා කෙළෙහි ය, මෙන්න, මම මෙහි ය"යි කී ය. එවිට, සමිඳාණන් වහන්සේ ළමයාට අඬගසන බව ඒලී තේරුම් ගත්තේය. එබැවින් ඒලී සාමුවෙල්ට කතා කොට, "ඔබ ගෙස් නිදාගන්න. ඔබට නැවත අඬගැසුවොත්, 'සමිඳාණන් වහන්ස කතා කළ මැනව; ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටිනවා'යි කියන්නැ"යි කීවේ ය. සාමුවෙල් ගොස් තමාගේ යහනේ නිදාගත්තේ ය. එවිට සමිඳාණන් වහන්සේ වැඩම කර, පළමු වතාවල දී මෙන්, "සාමුවෙල්, සාමුවෙල්" කියා අඬගැසූ සේක. සාමුවෙල් පිළිතුරු දෙමින්, "කතා කළ මැනව; ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටිනවා ය" යි කීවේ ය. සාමුවෙල් වැඩුනේය. සමිඳාණන් වහන්සේ ඔහු සමඟ සිට ඔහු කී හැම දෙයක්ම එකක් වත් නැර ඉෂ්ට කළ සේක.
දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 40:1,3,6-9

පිළිතුර: මාගේ දෙවියනී, ඔබේ කැමැත්තට මම ප්‍රිය වෙමි.

ගීය: මම ඉවසිල්ලෙන් හිමි තුමන් ගැන බලාපොරොත්තුවෙන් සිටියෙමි. හිමි තුමාණෝ මාගේ දුක් ගැනවිලි වලට සවන් දුන් සේක. දෙවිඳුන් හට තුති පවසන නව ගීයක් මා මුවේ තැබූ සේක. මෙය දැක බොහෝ දෙනෙකු ගරු බියෙන් ඇලළී සමිඳුන් කෙරෙහි අදහනු ඇත.

ඔබ පුද පඬුරට ප්‍රසන්න නැත. දවන යාග පූජා හා පූප පූජාවලින් ඔබට වැඩක් නැත. ඒ වෙනුවට ඔබ වදන් අසන පිණිස මාගේ දෙසවන දුන් සේක. එවිට මම, "මෙන්න, මම මෙහි ය"යි කීවෙමි. මා පිළිබඳ අණ පණත් ඔබේ ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත.

මාගේ දෙවියනි, ඔබේ කැමැත්තට ප්‍රිය වෙමි. ඔබේ නීති මසිතෙහි නිදන් කරගතිමි. සමිඳුනි, ඔබට වඳින පිරිස් මැද, ඔබේ ගැළවීමේ ක්‍රියා වර්ණනා කළෙමි. නොනවත්වා එය තවත් වර්ණනා කරන බව ඔබ දන්න සේක.

## <u>දෙවන කියැවීම</u>

1කොරින්ති 6:13-15,17-20

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**ඔබගේ ශරීර ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් බව නොදන්නහු ද?**

"ආහාර උදරය සඳහා ය, උදරය ආහාර සඳහා ය" යි කීවත් දෙවියන් වහන්සේ ඒ දෙක ම නැති කරන සේක. තවද ශරීරය අනාචාරය පිණිස නොවේ. එය ස්වාමීන් වහන්සේ උදෙසා ය. දෙවියන් වහන්සේ ස්වාමීන් වහන්සේ මරණයෙන් උත්ථාන කළ සේක. ස්වකීය බලයෙන් අපත් උන් වහන්සේ එසේ උත්ථාන කරන සේක. ඔබගේ ශරීර ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් බව නොදන්නහු ද? එසේ නම් මම ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් පැහැර ගෙන ඒවා ගණිකාවකගේ අවයවයන් කරම් ද? එහෙත් ස්වාමීන් වහන්සේට සම්බන්ධ වන තැනැත්තේ උන් වහන්සේ සමග ඒකාත්මයක් වන්නේ ය. අනාචාරයෙන් පලා යන්න. අන් හැම පාපයක් ම මිනිසා කරන්නේ ශරීරයෙන් බැහැර ය. එහෙත් අනාචාරය කරන්නා තමාගේ ම ශරීරයට විරුද්ධ ව පව් කරයි. ඔබගේ ශරීරය, දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නහු ද? ඔබ ඔබට ම අයිති නැත. ඔබ මිලයකට ගත් අය වන්නාහු ය. එබැවින් ඔබගේ ශරීර දේව මහිමය සඳහා යෙදවන්න.

දේව වාක්‍යය එසේ ය.

## <u>සාධුකාරය</u>

මතෙව් 11:25

ආලේලූයා! ආලේලූයා!

ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙහි ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි.

ආලේලූයා!

## <u>සුවිශේෂය</u>

සුවිශේෂක ජුවාම් තුමා විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය. ජුවාම් 1:35-42

**ඔව්හු උන්වහන්සේ වැඩවසන ස්ථානය දැක, එදින උන්වහන්සේ සමග ගත කළහ.**

පසුදින නැවතත් ජුවාම් සිය ගෝලයන් දෙදෙනෙකු සමග සිටියදී මඟ වඩිනා ජේසුස් වහන්සේ දෙස බලා, "බලන්න, දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ" යි කීය. ගෝලයෝ දෙදෙන ඔහු කී දේ අසා ජේසුස් වහන්සේ පසුපස ගියහ. ජේසුස් වහන්සේ හැරී ඔවුන් තමන් පසුපස එනු දැක,"ඔබ කුමක් සොයන්නහුදැ" යි ඇසූ සේක. ඔවුහු ද, "රබ්බි, (එහි තේරුම ගුරු දේවයෙනි, යනුයි) ඔබ වැඩවසන්නේ කොතනදැ" යි ඇසූහ. "ඇවිත් බලන්නැ" යි උන්වහන්සේ ඔවුන්ට වදාළ සේක. එසේ ඔව්හු අවුත් උන්වහන්සේ වැඩවසන ස්ථානය දැක, එදින උන්වහන්සේ සමග ගත කළහ. වේලාව සවස හතරට පමණ විය. ජොහාන්ගේ කීම අසා උන්වහන්සේ පසුපස ගිය දෙදෙනාගෙන් එක් තැනැත්තෙක් නම්, සීමොන් පේදුරුගේ සොහොයුරු ඇන්ඩෘය. ඔහු පළමුවෙන් තම සොහොයුරා මුණගැසී," අපට මෙසියස්වහන්සේ හමුවූහ" යි කීය. ('මෙසියස්' යන්නෙහි අර්ථය 'ක්‍රිස්තුස්' යනුයි.) ඔහු ජේසුස් වහන්සේ වෙත සීමොන් කැඳවාගෙන ආවේය. ජේසුස් වහන්සේ ඔහු දෙස බලා, "ඔබ ජුවාම්ගේ පුත් සීමොන්ය. ඔබට 'කේපස්' යයි කියනු ඇතැ" යි වදාළ සේක. ('කේපස්' යන්නෙහි අර්ථය පර්වතය යනුයි.)

සුවිශේෂ වාක්‍යය එසේ ය.